**කාත්තන්කුඩි නගර සභාව - 2017**

**මඩකලපුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 13 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කාත්තන්කුඩි නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රකාශය ප්‍රකාරව, ඉඩම් හා ගොඩනැගිලි මිලදී ගැනීම සඳහා රු.11,035,346 ක් වැයකර තිබුණි. එසේ වුවත්, මූල්‍ය ප්‍රකාශනයේ ඒවා මිලදී ගැනීම සඳහා රු.11,257,906 ක් වැයකර තිබූ බව දැක්වීම හේතුවෙන් රු.222,560 ක් වැඩිපුර පෙන්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල වාහනයක් මිලදී ගැනීමකින් තොරව වාහන මිලදී ගැනිම සඳහා වූ ගිණුම රු. 5,405,000කින් හර කර හා මූලධන වියදම් ගිණුම බැර වශයෙන් ගිණුම් තබා තිබුණි. භෞතිකව වත්කම් නොමැතිව සමුච්චිත අරමුදල ද මෙම වටිනාකමින් වැඩියෙන් දැක්වීම මූල්‍ය ප්‍රකාශනවල සත්‍ය තත්ත්වය හා නිවැරදිභාවය විද්‍යාමාන වී නොතිබුණි.

**1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජලය බෙදාහැරීම සම්බන්ධයෙන් ජල සම්පාදන හා මලාපවහන මණ්ඩලයට ගෙවිය යුතු රු. 6,642,880ක් පසුගිය වර්ෂ 22කට අධික කාලයක සිට ගෙවා නිරවුල් කිරීමට කටයුතු නොකර අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඩදිරිපත් කරමුන් පැවතුණි.

(ආ) 1991 වර්ෂයේදී ලංකා විදුලිබල මණ්ඩලයට ලබා දී තිබූ රු.2,399,352 ක අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතු නොකර අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරමින් තිබුණි.

(ඇ) විශ්‍රාම ගිය, සේවය හැර ගිය සහ මියගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයකර ගත යුතු රු.39,276 ක හිඟ ණය ශේෂ විශ්‍රාම පාරිතෝෂිතයෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට 2017 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**1.3.3 ලේඛනගත සාක්ෂි නොවීම**

**---------------------------------**

පහත සඳහන් එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| **විෂයය** | **වටිනාකම** | **ඉදිරිපත් නොවූ සාක්ෂි** |
|---|---:|---|
| ---------- | -------------- | --------------------------- |
| | රු. | |
| ඉඩම් | 15,820,000 | ඉඩම් හිමිකම් ඔප්පු |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 15,275,877 | විස්තරාත්මක උපලේඛන |

**2. මූල්‍ය සමාලෝචනය**

**-----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**------------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,504,832 ක් වූ අතර ඉකුත් වර්ෂය සමග සැසඳීමේ දී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,092,846 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 3,411,987 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

**2.2 ආදායම් කළමනාකරණය**

**-----------------------------**

**2.2.1 හිඟ ආදායම්**

**-------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වරිපනම් බදු**

**-------------------**

2016 හා 2017 වර්ෂවලදී වරිපනම් බදු හිඟ පිළිවෙලින් රු.6,358,166 ක් සහ රු.8,461,186 ක් වූ අතර සභාවේ හිඟ වරිපනම් වටිනාකම වාර්ෂිකව ප්‍රමාණාත්මක ලෙස වැඩිවෙමින් පැවැති නමුත් සභාව විසින් මේ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**(ආ) ව්‍යාපාර බලපත්‍ර ගාස්තු**

**-----------------------**

අයකරගත යුතුව පැවැති රු.19,500 ක ව්‍යාපාර බලපත්‍ර ගාස්තු සමාලෝචිත වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**3.1** **කාර්යසාධනය සමාලෝචනය**

**(අ)** **තිරසාර සංවර්ධන අරමුණු**

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ නායකත්වයෙන් 2015 වර්ෂයේ තිරසර සංවර්ධන සම්මේලනයේ තීරණය අනුව සභාව විසින් 2030 වර්ෂයේ ලඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ආ)** **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

2010-2015 කාලපරිච්ඡේදයේදී "පිළිසරු" මූල්‍යාධාර වැඩසටහන මගින් ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ඉඩමක් මිලදීගෙන ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණද ඝන අපද්‍රව්‍ය සභා බල ප්‍රදේශයේ ගං ඉවුරේ බැහැර කරමින් තිබුණි. මේ නිසා පරිසරයට අධික වශයෙන් හානි සිදු වී තිබුණි. එසේ වුවත්, සභාව විසින් මේ සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර කළමනාකරණය ද මේ සම්බන්ධ ගැටළු පාලනය සඳහා පියවර ගෙන නොතිබුණි.

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1** **පාර්ලිමේන්තුවේ ගිණුම්කාරක සභා කමිටුවේ වාර්තා**

කාත්තාන්කුඩි නගර සභාවේ 2017 වර්ෂයේ පාර්ලිමේන්තු ගිණුම් කාරක සභා වාර්තාවේ අනාවරණය කර තිබූ කරුණු සම්බන්ධයෙන් මේ දක්වා පියවර ගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

(අ) කින්නියා සහ ත්‍රිකුණාමලය අතර මඟීන් ප්‍රවාහනය සඳහා භාවිතා කරනු ලැබූ බෝට්ටුව කාත්තාන්කුඩි කොක්කඩිච්චෝලෙයි සඳහා ප්‍රවාහන කටයුතු සඳහා යොදවා ගැනීමට රු.323,550 ක් වැයකර කාත්තාන්කුඩිය වෙත ගෙනැවිත් තිබුණි. කාත්තාන්කුඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මෙම බෝට්ටුව අලුත්වැඩියාව සඳහා රු.489,500 ක් වැය කර තිබුණි. කෙසේ වුවද, මෙය 2017 සැප්තැම්බර් 15 දින වන විටත් භාවිතයට ගෙන නොතිබුණි.

(ආ) 1995 සිට 2013 දක්වා පළාත් සභා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට ගෙවිය යුතු වූ මාසික දායකය රු.2,375,058 ක් මේ දක්වා ගෙවා නිරවුල් කර නොතිබුණි.

(ඇ) **ප්‍රමාණවත් අධිකාරී බලය නොමැති ගනුදෙනු**

1992 වර්ෂයේ කාත්තාන්කුඩි නගර සභාවට පරිත්‍යාග කරනු ලැබූ රු.600,000 ක් වටිනා රෝද හතරේ ට්‍රැක්ටරයක් 2014 දෙසැම්බර් 31 දින වන විටත් භාවිතා කර නොතිබුණි. මෙම යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සඳහා 2012 වර්ෂයේදී එකතුව රු.315,203 ක් සභාව විසින් වැය කර තිබුණි. කෙසේ වෙතත්, 2015 මැයි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය අනාවරණය කර තිබූ කොන්දේසි සැලකිල්ලට නොගෙන සභාවේ ලේකම්වරයා විසින් රු.16,150 ක මුදලකට මෙය වෙන්දේසියේ විකුණා තිබුණි.

(ඇ) **කොන්ත්‍රාත් පදනම මත සේවකයන් පත්කිරීම**

**------------------------------------------------------**

අනුමත සේවක සංඛ්‍යාවට වඩා නිලධාරීන් 25 දෙනෙකුගේ අතිරික්තයක් ඒ වන විටත් පැවැතියද අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය සහ මේ සම්බන්ධ මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීමේ අනුමැතිය ලබා නොගෙන ද නැගෙනහිර පළාත් ප්‍රධාන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ ඉල්ලීම පදනම් කරගනිමින් 2015, 2016 සහ 2017 වර්ෂවලදී කොන්ත්‍රාත් පදනමින් සේවකයින් 77 දෙනෙකු සභාව විසින් පත් කර තිබුණි.

තවද, සභාව විසින් නඩත්තු කළ පුස්තකාල 02 ක් සහ කියවීම් ශාලා 04 ක් සඳහා අනුමත කළ සේවක සංඛ්‍යාව 09 දෙනෙකු වුවත්, එම පුස්තකාල සහ කියවීම් ශාලා සඳහා අනියම් සේවකයින් 11 දෙනෙකු ඇතුළුව සේවකයින් 23 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ඉ) **රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායකත්ව මුදල් ප්‍රේෂණය නොකිරීම**

**--------------------------------------------------------------------------**

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2011 පෙබරවාරි 24 දිනැති අංක 2/2011 දරන චක්‍රලේඛය ප්‍රකාරව, අනියම් හා තාවකාලික සේවකයින්ගේ දායක මුදල් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය කළ යුතුයි. කෙසේ වෙතත්, 2015, 2016 සහ 2017 වර්ෂවලදී පත්වීම් ලැබූ සේවකයින් 77 දෙනෙකු වෙනුවෙන් වූ දායක මුදල් ඔවුන්ගේ වැටුපෙන් අඩුකර රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය කර නොතිබුණි.

(ඊ) **පුස්තකාල ගොඩනැගිල්ල කුලියට දීම**

**-----------------------------------------**

තක්සේරු දෙපාර්තමේන්තුව පුස්තකාල ගොඩනැගිල්ලේ මාසික කුලිය රු.125,000 ක් තක්සේරු කර තිබුණු නමුත් 2014 වර්ෂයේදී, වර්ෂ 04 ක කාලපරිච්ඡේදයක් සඳහා රු.5,000 ක මාසික කුලියක් මත පුද්ගලික අධ්‍යාපන ආයතනයකට මෙම ගොඩනැගිල්ල සභාව විසින් කුලියට ලබා දී තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සභාව විසින් රු.4,755,000 ක කුලියක් අහිමි කර තිබුණි.

**4.2** **අයවැය පාලනය**

**----------------------**

සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු සහ අනෙකුත් ආදායම් සඳහා ඇස්තමේන්තු කළ ආදායම් සහ තථ්‍ය ආදායම් අතර 28% ක් දක්වා වන විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය වනාහී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබූ බව නිරීක්ෂණය විය.

**5.** **පද්ධති හා පාලන**

**------------------**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| **පාලන ක්ෂේත්‍රය** | **විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන්** |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | ලැබිය යුතු දෑ සහ ගෙවිය යුතු දෑ ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ඇ) සන අපද්‍රව්‍ය කළමනාකරණය | සන අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් විධිමත් සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |